ඝාතන දිවි තොර කරගැනීමක් බොහෝ විට වඩාත් ඉහළ අවධානයක් ලබාගන්නා බව මාධ්‍ය මාර්ගෝපදේශයන් පෙන්වා දේ. එනිසා, මෙවැනි සිදුවීම් වාර්තා කිරීමේදී ආචාර ධාර්මික ප්‍රවේශයක් ලබාගැනීමට මාධ්‍ය විශේෂයෙන්ම වගකීම් සහගත විය යුතුයි.

වැල්ලව වරද්දන ප්‍රදේශයේ කාන්තාවක් සහ ඇගේ තුන් හැවිරිදි දියණිය සම්බන්ධ වූ ඝාතන දිවි තොර කරගැනීමේ සිදුවීමක් මව්බිම සහ ලංකාදීප පුවත්පත්, අරුණ පුවත්පත සහ දෙරණ අරුණ වැඩසටහන මගින් වාර්තා කර තිබූ ආකාරය මෙහිදී ඝාතන-දිවි තොර කරගැනීමක් මාධ්‍ය ආචාර ධර්මයන්ට අනුකූල නොවන ලෙසින් සිදුවන වාර්තාකරණයන්ට නිදසුන් වේ.

එහිදී,

දිවි තොර කරගත් ආකාරය සඳහන් කරයි.
දිවි තොර කරගැනීමට හේතුව සරලව දක්වයි.
උපකාරක අංක සඳහන් නොකරයි.

ඝාතන-දිවි තොර කරගැනීමක් මේ අයුරින් වාර්තා කිරීම කෙතරම් වගකීම් සහගත යැයි ඔබ සිතන්නේ ද?

මෙම පුවත් වාර්තාකරණයන් ඔස්සේ, අනුකාරක සිදුවීම් වලට ද මඟ පාදන්නට හැකියාවක් නොතිබෙන්නේ ද?

උපකාරක අංකයක් සඳහන් කරමු, ජීවිතයක් රැකගනිමු!

හදිසි උපකාරක අංක:
*1333-CCCline
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926

(මෙම පුවත එදින සහෝදර ඉංග්‍රීසි පුවත්පත් තුළ වාර්තා වී නොතිබුණි. Ceylon Today ඔස්සේ එය වාර්තා වී තිබූ නමුත්, දිවි තොර කර ගැනීමක් ලෙසින් වාර්තා වී නොතිබුණි.)

මූලාශ්‍ර:
https://www.nsrf.ie/.../Briefing_Murder-suicide_NSRF_26...
https://media.samaritans.org/.../Guidance_for_reporting...

** අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න!ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!